*සැ. යු.*--2009.05.22 දින පළ කරන ලද අංක 1,603 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ ජූරි සභික නාමාවලියක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,604 - 2009 මැයි මස 29 වැනි සිකුරාදා - 2009.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | -- | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 496 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජුනි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මැයි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

681 - B 080017 —9,165 (2009/05)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
(ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය)

සමාජ වැඩ පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව - සිංහල මාධ්‍යය/දෙමළ මාධ්‍යය - 2009/2011

සමාජ වැඩ පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ 2009/2011 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ සමාජ සේවා, සමාජ සුභසාධන හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, කුසලතා හා ආකල්පවලින් පිරිපුන් සමාජ වැඩ වෘත්තිකයින් බිහි කිරීමයි.

01. ඇතුලත්වීමේ සුදුසුකම් :-

(i) අ.පො.ස (උ.පෙළ) සමත්වීම (විෂයයන් 03ක් සඳහා සාමාර්ථ ලබා ගැනීම) ;

හෝ

(ii) (අ) රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරක (හෝ වැඩි ගණනක) අවුරුදු 03 කට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

(i) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ, දිළිඳු සහන දෙපාර්තමේන්තුවේ හා පළාත් සභාවල සමාජ සේවා නිලධාරි
(ii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි, සහතික කළ පාසල්වල පාසල්පති, නිවාසාචාර්ය හා උප නිවාසාචාර්ය, ළමා රක්ෂක නිලධාරි,
(iii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් හා සුභසාධන නිලධාරි,
(iv) සමුපකාර දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන/පරීක්ෂක නිලධාරි,
(v) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාම නිලධාරි,
(vi) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරි, සහකාර ග්‍රාම සංවර්ධන නිලධාරි,
(vii) ජාතික තරුණ සේවා සභාවේ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරි, තරුණ සේවා නිලධාරි, (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) හා සහකාර තරුණ සේවා නිලධාරි,
(viii) කර්මාන්ත හා වැවිලි ක්ෂේත්‍රයේ රාජ්‍ය නීතිගත සංස්ථා, මණ්ඩල, පෞද්ගලික අංශයේ ප්‍රජා සංවර්ධන නිලධාරි, සුභසාධන නිලධාරි,
(ix) සමෘද්ධි සංවර්ධන නිලධාරි,
(x) මුල් ළමාවිය සංවර්ධන නිලධාරි,
(xi) වනිතා සංවර්ධන නිලධාරි,
(xii) සංවර්ධන සහකාර (සමාජ සේවා දෙපාර්තමේන්තුව)
(xiii) වැඩසටහන් සහකාර (සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය)
(xiv) උපදේශන සහකාර (සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය)
(xv) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි,
(xvi) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි,
(xvii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා පළාත් සභාවල ගුරුවරුන්
(xviii) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ධීවර සමාජ සංවර්ධන සහකාර,
(xix) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරි,
(xx) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය හෙද/හෙදි නිලධාරින්, මනෝ වෛද්‍ය සමාජ සේවක
(xxi) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන කොමිෂන් සභාවේ ප්‍රජා මණ්ඩල නිලධාරි, පළාත් පාලන නිලධාරි, සහන නිලධාරි,
(xxii) රජයේ හෝ රජයේ නොවන හෝ පෞද්ගලික අංශයේ ආයතනවල හෝ සමාන තනතුරු දරන නිලධාරින්,
(xxiii) මානසික සෞඛ්‍ය සංවර්ධන සහකාර නිලධාරි (සෞඛ්‍ය අමාත්‍යාංශය),
(xxiv) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යාපන සභාවේ අනුමැතියට යටත්ව ඉහත සඳහන් සුදුසුකම් හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සටහන :

(i) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් හෝ සමාජ සුභසාධන / සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් තිබෙන අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

02. *වයස් සීමාව.-*
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 20 ට නොඅඩු සහ අවුරුදු 46 ට නොවැඩි විය යුතු ය.

03. ***වෙනත් කොන්දේසි.-***

(i) රැකියාවල නියුතු හෝ දැනටමත් වෙනත් පාඨමාලා හදාරන අය දෙවර්ෂ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට බැඳීමට අදහස් කරන්නේ නම්, වර්ෂ දෙකක කාලයක් සඳහා නිවාඩු ලබා ගැනීම අත්‍යවශ්‍ය වන අතර නිවාඩු ලබා ගැනීමේ සම්පූර්ණ වගකීම අයදුම්කරු සතු වේ. පාඨමාලාවේ ලියාපදිංචියට පෙර අධ්‍යයන නිවාඩු ලබා ගත යුතුය.

(ii) පාඨමාලාවේ කාලසීමාව තුළ දී වෙනත් පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමට අවසර නොමැති අතර වෙනත් පාඨමාලාවක් හදාරන බව හෙළි වුවහොත් මෙම පාඨමාලාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

04. ***විෂයමාලාව පහත සඳහන් පරිදි සමාසික 4 කින් සමන්විත වේ.-***

(i) පළමු වසර - පළමු සමාසිකය

| | | |
|---|---|---|
| ස. වැ. ඩි 111 | - | සමාජ වැඩ හැඳින්වීම |
| ස. වැ. ඩි 112 | - | සමාජ පරිසරය |
| ස. වැ. ඩි 113 | - | මානව වර්ධනය හා සංවර්ධනය |
| ස. වැ. ඩි 114 | - | පුද්ගලයින් සහ පවුල් සමග වැඩ කිරීම |
| ස. වැ. ඩි 115 | - | ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන සේවා |
| ස. වැ. ඩි 116 | - | ක්ෂේත්‍ර පුහුණුව I |
| ස. වැ. ඩි 117 | - | xyz (අතිරේක විෂය) |

(ii) පළමු වසර - දෙවැනි සමාසිකය

| | | |
|---|---|---|
| ස. වැ. ඩි 121 | - | සමාජ කණ්ඩායම් සමග වැඩ කිරීම |
| ස. වැ. ඩි 122 | - | ගැටුම් නිරාකරණය හා සාමය ගොඩනැගීම |
| ස. වැ. ඩි 123 | - | ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න |
| ස. වැ. ඩි 124 | - | සම්පරීක්ෂණ පරිචය |
| ස. වැ. ඩි 125 | - | මානව අයිතිවාසිකම් හා සමාජ වැඩ |
| ස. වැ. ඩි 126 | - | ක්ෂේත්‍ර පුහුණුව II |

(iii) දෙවන වසර - පළමු සමාසිකය

| | | |
|---|---|---|
| ස. වැ. ඩි 211 | - | ප්‍රජාව සමග වැඩ කිරීම |
| ස. වැ. ඩි 212 | - | සමාජ සුභසාධන, පරිපාලනය සහ ප්‍රතිපත්ති |
| ස. වැ. ඩි 213 | - | සමාජ වැඩ පර්යේෂණ |
| ස. වැ. ඩි 214 | - | මානව වාසභූමිවල සේවා සැපයුම |
| ස. වැ. ඩි 215 | - | මානව වාසභූමිවල සේවා සැපයුම (ක්ෂේත්‍ර පුහුණුව) |
| ස. වැ. ඩි 216 | - | මානසික සෞඛ්‍ය හා උපදේශනය |
| ස. වැ. ඩි 217 | - | අපරාධ, ප්‍රචණ්ඩත්වය හා බාලාපචාර |
| ස. වැ. ඩි 218 | - | ආපදා කළමනාකරණය |

(iv) දෙවන වසර - දෙවැනි සමාසිකය

| | | |
|---|---|---|
| ස. වැ. ඩි 221 | - | ක්ෂේත්‍ර පුහුණුව III |

* පළමු වර්ෂය - පළමු වසරේ පළමු සමාසිකය තුළ විෂයයන් 05ක් පංතිකාමර දේශන පැවැත්වෙන අතර පැය 288ක ක්ෂේත්‍ර පුහුණුවක් ලබා දේ.

පළමු වසරේ දෙවන සමාසිකය තුළ විෂයයන් 05ක් පංතිකාමර දේශන පැවැත්වෙන අතර පැය 300ක ක්ෂේත්‍ර පුහුණුවක් ලබා දේ.

* දෙවැනි වර්ෂය - දෙවැනි වසරේ පළමු සමාසිකය තුළ විෂයයන් 07 ක් පංතිකාමර දේශන පැවැත්වෙන අතර මානව වාසභූමිවල සේවා සැපයුම පිළිබඳ දින 10ක ක්ෂේත්‍ර පුහුණුවක් ද ඇතුලත් වේ.

දෙවැනි වසරේ දෙවැනි සමාසිකය සම්පූර්ණයෙන් ම පැය 960 ක ක්ෂේත්‍ර පුහුණුවක් ලබා දේ.

05. ***ඩිප්ලෝමා ප්‍රදානය.-***

පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන සිසුන්ට ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරනු ලැබේ :-

(අ) ක්ෂේත්‍ර පුහුණුව ඇතුලත්ව ඉහත සඳහන් සියලුම විෂයයන්ගෙන් සමත්වීම,

(ආ) පාඨමාලා හා ක්ෂේත්‍ර වැඩවලට පූර්ණ සහභාගිත්වයක් තිබීම, විශිෂ්ට හැසිරීමකින් යුක්ත වීම හා ඩිප්ලෝමා ලැබීමට සුදුස්සකු වශයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ විභාග මණ්ඩලය විසින් තීරණය කරනු ලැබීම.

06. බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය මාතර, කොළඹ, මහනුවර, අනුරාධපුරය, යාපනය සහ අම්පාර යන නගරවල විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ. (අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විභාග මධ්‍යස්ථාන අවලංගු කර ලඟම පිහිටි විභාග මධ්‍යස්ථානයට අනුයුක්ත කරනු ලැබිය හැකිය.)

07. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට පමුණුවනු ලැබේ. අවසාන තීරණය ගනු ලබන්නේ ආයතනයේ බඳවා ගැනීමේ මණ්ඩලය විසිනි.

08. පාඨමාලාව ආරම්භ වන දිනය : 2009.10.20 (වෙනස් වීමට ඉඩ ඇත)

09. පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය : සිංහල/දෙමළ

10. *අයදුම්පත්.-* මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූලව 11 ½" x 8 ½" ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් සමග රාජගිරිය තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි වන පරිදි අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමාජ සංවර්ධන ආයතනය නමට ලියන ලද රු. 100 ක මුදල් ඇණවුමක් 2009.06.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරී, ජාතික සමාජ සංවර්ධන ආයතනය, අංක 488 ඒ, නාවල පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර පැමිණ ආයතනයෙන් ලබා ගන්නේ නම් රු. 50 ක මුදලක් ගෙවා ලබා ගත හැකිය. දැනට රැකියාවල නියුක්ත අයදුම්කරුවන් අයදුම්පත් එවිය යුත්තේ තම සේව්‍යායාගේ මාර්ගයෙනි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය ඉක්මවා ලැබෙන සියලුම අයදුම්පත් ද, නියමිත සුදුසුකම් සපුරා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එම්. ඒ. අල්ලාම්,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2009 මැයි මස 13 වැනි දින,
රාජගිරිය, නාවල පාර,
488 ඒ, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***ජාතික සමාජ සංවර්ධන ආයතනය***
***(ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය)***

*සමාජ වැඩ පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව*
*සිංහල මාධ්‍යය/දෙමළ මාධ්‍යය - 2009/2011*

| | |
|---|---|
| | |
| | |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. මුලකුරු සමග නම :
(i) (සිංහලෙන්) :—————.
(ii) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

04. විවාහක/අවිවාහක බව :—————.

05. උපන් දිනය:—————.

2009.06.25 දිනට වයස :—————. අවුරුදු :—————. මාස :—————. දින :—————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

07. ලිපිනය (පෞද්ගලික) ඃ

(i) (සිංහලෙන්) :————.

(ii) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
දුරකථන අංකය :————.

ලිපිනය (රාජකාරි)

(i) (සිංහලෙන්) :————.

(ii) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
දුරකථන අංකය :————.

08. පදිංචි දිස්ත්‍රික්කය :————.

09. පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

10. ලිඛිත පරීක්ෂණය සඳහා ඔබ පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය :————.
(විභාගය පවත්වනු ලබන්නේ මාතර, කොළඹ, මහනුවර, අනුරාධපුරය, යාපනය සහ අම්පාර නගරවල පමණි.)

11. පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන මාධ්‍යය ඃ
(සිංහල/දෙමළ) :————.

12. අධ්‍යාපන සුදුසුකම් :

| සමත් වූ විභාගය | විෂයයන් | සාමාර්ථය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | මාධ්‍යය | විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| 01. අ. පො. ස. (සා/පෙළ)/ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර | 01.<br>02.<br>03.<br>04.<br>05.<br>06.<br>07.<br>08. | | | | |
| 02. අ. පො. ස. (උ. පෙළ) | 01.<br>02.<br>03.<br>04. | | | | |
| විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට අවම සුදුසුකම් ලබා තිබුණේ ද ? ඔව්/නැත | | | | | |

3. උපාධිය ඃ

| විෂයයන් | සාමාර්ථය | වර්ෂය හා මාධ්‍යය | විශ්ව විද්‍යාලය |
|---|---|---|---|
| 01.<br>02.<br>03.<br>04. | | | |

13. *වෙනත් අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :*

(i) ……………………………………………………………………………………..
(ii) ……………………………………………………………………………………..
(iii) ……………………………………………………………………………………..

14. *දැනට නියුතු රැකියාව හා කලින් නියුක්තව සිටි රැකියා :*

| *දෙපාර්තමේන්තුව/ආයතනය* | *තනතුර* | *කාලසීමාව* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

15. වෙනත් සුදුසුකම් : (සමාජ සුභසාධනය පිළිබඳ ලබා ඇති පළපුරුද්ද සමාජ සේවා සංවිධානවල දරා ඇති නිලතල, විශේෂ දක්ෂතා හා රුචිකත්වයන් පිළිබඳ සඳහන් කරන්න. (අවශ්‍ය නම් වෙනත් පත් ඉරුවක් අමුණන්න) :————.

16. දැනට වෙනත් පාඨමාලාවන් කිසිවක් හදාරන්නේ නම් විස්තර දක්වන්න. :————.

17. මෙම පාඨමාලාව තෝරා ගැනීමට හේතු :————.

මා විසින් ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව සහතික කරමි. තෝරා ගැනීමෙන් අනතුරුව ඉන් කිසිවක් අසත්‍ය බව පෙනී ගියහොත් පාඨමාලාවෙන් මා නෙරපා හරිනු ලැබීමට යටත්වන බව දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**සේව්‍යයාගේ නිර්දේශය**

……………………………හිමි/මයා/මිය/මෙනෙවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. අයදුම්කරුගේ ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදිය. ඔහු/ඇය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා වැටුප් සහිත/රහිත නිවාඩු පිට මුදාහැරිය හැකිය.

————.
දෙපාර්තමේන්තුවේ/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
පදවි නාමය:————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
නිල මුද්‍රාව :————.

05-553

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ජාතික වෘත්තීය පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත

2009 II වන අර්ධ වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *පා. අං.* | *පාඨමාලාව (පූර්ණ කාලීන)* | *පාඨමාලා කාලය* | | *පාඨමාලා ගාස්තුව රු.* |
|---|---|---|---|---|
| | | *ආයතනික පුහුණුව මාස* | *සැබෑ වැඩබිම් පුහුණුව* | |
| 01 | ප්‍රමාණ සමීක්ෂණ (Quantity Surveyor) | 06 | 06 | 20,000 |
| 02 | මෝටර් රථ පින්තාරු ශිල්පී (Automobile Painter) | 06 | 06 | 1,500 |
| 03 | පරිගණක යෙදුම් සහායක (Computer Application Assistant) NVQ Level - 03 | 06 | 06 | 4,000 |
| 04 | පරිගණක (දෘඩාංග) (Computer Hard Ware Technician A) NVQ Level - 03 | 06 | 06 | 10,000 |
| 05 | මෝටර් රථ වෑද්දුම් ශිල්පී (Automobile Tinker) - Level 03 | 06 | 06 | නොමිලේ |
| 06 | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී (Aluminium Fabricator) Level 03 | 06 | 06 | 2,000 |
| 07 | කාර්යාල උපකරණ අළුත්වැඩියාව (Office Equipment Repairer) | 12 | 12 | 5,000 |
| 08. | ජංගම දුරකථන අළුත්වැඩියාව (Mobile Phone Repairer) | 06 | 06 | 10,000 |
| 09 | විදුලි මෝටර් එතුම් කාර්මික (Electric Motor Winder) | 06 | 06 | නොමිලේ |

පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :

* අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වයස් සීමාව - අවුරුදු 16-30 අතර වේ.

*අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

* පාඨමාලා අංක 01 සඳහා අ.පො.ස. (සා. පෙ) ගණිත හා විද්‍යා විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර උ. පෙ. විද්‍යා හෝ ගණිත අංශයෙන් පෙනී සිට තිබීම විශේෂ සුදුසුකමක් වේ.
* පාඨමාලා අංක 03, 04 සඳහා අ.පො.ස. (සා.පෙ) ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබිය යුතු අතර අංක 07 සඳහා සා. පෙ. විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය.
* අනෙකුත් සියළුම පාඨමාලා සඳහා 9 ශ්‍රේණිය සමත් වීම හෝ අ.පො.ස. (සා. පෙළ) පෙනී සිටීම වුව ද ප්‍රමාණවත් වේ.
* අපේක්ෂකයාගේ දැනුම, ආකල්ප හා කුසලතා පදනම් කරගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම ද සලකා බලනු ලැබේ.

*ඉහත පාඨමාලා හදාරණ ඔබට, ඔබේ දරුවාට පුහුණු කාලය තුල ලැබෙන පහසුකම් :*

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම්,
* අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව,
* රැකියා ලොව ඉහල පිළිගැනීමට ලක් වූ ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය නිපුණතා සහතිකය (NVQ Level),
* වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම,
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්,
* සහනදායී මිලට ලංගම මගී වාර ප්‍රවේශ පත්‍ර,
* නායකත්ව හා සෞඛ්‍ය පුහුණු වැඩසටහන්,
* සෑම පාඨමාලාවකටම නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය.

*විශේෂයි :*

* සම්පූර්ණ පුහුණු පාඨමාලා කාලයෙන් මාස 06 ක් පාඨමාලාවට අදාළව ආයතනික පුහුණුව
* ආයතනික පුහුණු කාලය තුළ සිත්ගන්නා සුලු දීමනාවක්
* පුහුණුවෙන් පසු අනිවාර්යයෙන්ම රැකියාවක්
* කාන්තා අයදුම්කාරියන් සඳහා ප්‍රමුඛත්වය
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය

**පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම**

ඔබ හැදෑරීමට කැමති පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන් ඇතුළත් කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් 2009.06.20 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න :

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

දුරකථන අංකය : 0112572976

" ජීවිතයට හැකියාවක් - හැකියාවට රැකියාවක් "

05-569

---

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2009/2010**

මෙම නිවේදනයේ සඳහන් කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රමාණයට සිසුන් බඳවා ගනු ලැබේ.

02. දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රය" ට අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක තම තමන්ගේ අයදුම්පත් අයදුම්කරුවන් විසින් ම සකස් කර ගත යුතුවේ. සෑම අයදුම්පත්‍රයක් ම ආදර්ශ අයදුම්පතෙහි 12 වන අංකය යටතේ සඳහන් වන පරිදි වලංගු රු. 10 ක මුද්දරයක් අලවා සුපුරුදු අත්සන යොදා අවලංගු කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2009.06.24 වැනි දිනට හෝ ඊට පෙර, ඇතුලත්වීමට බලාපොරොත්තු වන කාර්මික විද්‍යාලයේ විදුහල්පතිට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ නමට හෝ රාජකාරි ලිපිනයට තැපැල් නොකළ යුතුයි.

03. කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා සංකේත අංකය යොදන්න.

උදා. : ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය - ඒ. ටී. සී. 05

04. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. පාඨමාලාවේ නම, සංකේත අංකය, පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන කාර්මික විද්‍යාලය, පාඨමාලාවේ මාධ්‍යය නිවැරදිව සඳහන් කිරීමට අයදුම්කරුවන් සුපරීක්ෂාකාරී විය යුතුය. විද්‍යාලය, පාඨමාලාව හෝ ඉගැන්වීමේ මාධ්‍යය වෙනස් කිරීම සඳහා පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

06. පහත දැක්වෙන පාඨමාලා ගාස්තු අනුව සියළුම අර්ධ කාලීන/සන්ධ්‍යා කාලීන පාඨමාලා හදාරන්නන්ගෙන් ගාස්තු අය කරනු ලැබේ :

(i) අවුරුද්දකට වැඩි සන්ධ්‍යා කාල/අර්ධ කාල සහතිකපත්‍ර පාඨමාලා සඳහා අධ්‍යයන වර්ෂයකට රු. 2,000 කි ;
(ii) එක් අවුරුදු හෝ ඊට අඩු කෙටි කාලීන, සන්ධ්‍යාකාල/අර්ධකාල පාඨමාලා සඳහා පාඨමාලාවකට රු. 1,500 කි.

07. *පාඨමාලාවල ස්වභාවය*.- ඒ ඒ පාඨමාලා සඳහා සුදුසුකම් හා පැවැත්වෙන විද්‍යාල පාඨමාලා හා භාෂා මාධ්‍යය සඳහා මෙම දැන්වීමේ දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛනය කෙරෙහි සියළුම අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. ඒ ඒ කාර්මික විද්‍යාලයේ ලිපිනය කාර්මික විද්‍යාල ලැයිස්තුවෙහි සඳහන් වේ.

08. මෙම විද්‍යාලයන්හි පාඨමාලා හැදෑරීමට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකු/ඉල්ලුම්කාරියක :

(i) මනා චරිතයකින් යුක්ත විය යුතුය,
(ii) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය,
(iii) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇතුලත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

09. සුදුස්සන් තෝරාගනු ලබන්නේ අභියෝග්‍යතා පරීක්ෂණයක හා/හෝ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

10. ලිපිලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළයුතුය. තේරීම් පරීක්ෂණයේදී අවශ්‍ය හා පිළිගත හැකි ලිපිලේඛන ඉදිරිපත් කර, යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

11. පූර්ණ කාල දිවා පාඨමාලා හදාරණ සිසුන් සඳහා තම පවුලේ ආර්ථික තත්ත්වය මත විද්‍යාලයේ පංතිවලට සහභාගි වන සෑම දිනකට ම රු. 20 ක දීමනාවක්, මසකට රු. 450 ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.

දිවා පූර්ණ කාලීන පාඨමාලා හදාරණ අඩු ආදායම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 840 කට පමණ රු. 2,500 බැගින් වූ වාර්ෂික ශිෂ්‍යාධාරයක් ගෙවනු ලැබේ.

12. සිය ලිපි ලේඛනවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. වංචනික හෝ වෙනස් කිරීම් සහිත ලිපි ලේඛන ඉදිරිපත් කරන හෝ සඳහන් කරුණු සනාථ වන සේ ලිපිලේඛන ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට විරුද්ධව තදින් ක්‍රියා කරනු ලැබේ.

ඕනෑම අයදුම්කරුවකු විසින් තමන් කැමති ඕනෑම පාඨමාලාවකට වෙන වෙනම ඉල්ලුම්පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ හැක.

ආචාර්ය එච්. එල්. ඔබේසේකර,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 557,
ඕල්කට් මාවත,
කොළඹ 10.

*කාර්මික විද්‍යාල ලැයිස්තුව*

| *අනු. අංකය* | *කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ |
| 02 | ගාල්ල කාර්මික විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල | ගාල්ල |
| 03 | මහනුවර කාර්මික විද්‍යාලය | අරුප්පල, මහනුවර | මහනුවර |
| 04 | යාපනය කාර්මික විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය |
| 05 | බදුල්ල කාර්මික විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල |
| 06 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල |
| 07 | අනුරාධපුරය කාර්මික විද්‍යාලය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය |
| 08 | කුරුණෑගල කාර්මික විද්‍යාලය | පුත්තලම් පාර, කුරුණෑගල | කුරුණෑගල |
| 09 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලු පාර, රත්මලාන | කොළඹ |
| 10 | අම්පාර හාඩි කාර්මික විද්‍යාලය | ඉඟිනියාගල පාර, අම්පාර | අම්පාර |
| 11 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර | මාතර |
| 12 | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ | අම්පාර |
| 13 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර |
| 14 | රත්නපුරය කාර්මික විද්‍යාලය | ෆාම් ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය |
| 15 | වරකාපොල කාර්මික විද්‍යාලය | අඹගල පාර, වරකාපොල | කෑගල්ල |
| 16 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල |
| 17 | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට | මහනුවර |
| 18 | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය | නුවරඑළිය |
| 19 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම | කොළඹ |
| 20 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට |
| 21 | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක | මහනුවර |

| අනු. අංකය | කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 22 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ |
| 23 | බලපිටිය කාර්මික විද්‍යාලය | වඳුරුව දුම්රියපොළ පාර, බලපිටිය | ගාල්ල |
| 24 | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | කුරුණෑගල |
| 25 | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්වන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව |
| 26 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල | බදුල්ල |
| 27 | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල | මොණරාගල |
| 28 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල | ගම්පහ |
| 29 | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| 30 | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය | අම්පාර |
| 31 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්. සී. පාර, මාතලේ | මාතලේ |
| 32 | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | හම්බන්තොට |
| 33 | මැදගම කාර්මික විද්‍යාලය | මැදගම (බිබිලේ හරහා) | මොණරාගල |
| 34 | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව | පොළොන්නරුව |
| 35 | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නව නගරය, ඇඹිලිපිටිය | රත්නපුරය |
| 36 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | වවුනියාව |
| 37 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | අක්කරෙයිපත්තුව | අම්පාර |
| 38 | ආණමඩුව කාර්මික විද්‍යාලය | ගම්උදා භූමිය, තම්මැන්නාගම, ආණමඩුව. | පුත්තලම |

*ආදර්ශ අයදුම්පත්‍රය*

**කාර්මික විද්‍යාලවලට ඇතුලත්වීමේ අයදුම්පත - 2009/2010 අධ්‍යයන වසර**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි [ ]

(අයදුම්පත්‍රය අදාළ කාර්මික විද්‍යාලයේ විදුහල්පති වෙතට යැවිය යුතුය. විදුහලේ ලිපිනය කාර්මික විද්‍යාල ලැයිස්තුවේ දක්වා ඇත.)

ඉල්ලුම්කරන සෑම පාඨමාලාවක් සඳහා වෙන වෙනම අයදුම්පත් අවශ්‍ය වේ.

01. කාර්මික විද්‍යාලයේ නම :————.

02. පාඨමාලාවේ නම :————. (දිවා/සන්ධ්‍යා/අර්ධ කාලීන)

 මාධ්‍යය :————. සංකේත අංකය :————.

03. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.

04. මුලකුරුවලින් කියවෙන නම් :————.

05. ස්ථිර ලිපිනය :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. දිස්ත්‍රික්කය :————. ඡන්ද කොට්ඨාසය :————.

 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

08. උපන් දිනය :————.

 2009.07.01 දිනට වයස :

 අවුරුදු :————. මාස :————. දින :————.

09. ස්ත්‍රී පුරුෂ භාවය :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

| විභාග අංකය | වර්ෂය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල (එක් වරක දී)

| විභාග අංකය | වර්ෂය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

(ඇ) අ. පො. ස (උ. පෙළ) විභාගයට පෙනී සිටි වාර ගණන ඃ————.

(ඈ) ඉහත සඳහන් (අ) සුදුසුකම් නොමැති නම් සමත් ව ඇති ඉහළම

ශ්‍රේණිය .................. වසර ..................

11. සන්ධ්‍යා/අධිකාලීන පාඨමාලා සඳහා පමණක් අදාල වේ.

**රැකියා අවශ්‍යතාවයන් ඉල්ලා ඇති පාඨමාලා සඳහා පමණක් මෙම කොටස සම්පූර්ණ කරන්න.**

11.1 අයදුම්කරුගේ නම :————.

11.2 දැනට දරන තනතුර හා ඊට පත් වූ දිනය :————.
ස්වයං රැකියාවක නියුක්ත නම් එහි ස්වභාවය :————.

11.3 සේවා ස්ථානය හා එහි ලිපිනය :————.

11.4 සේවක අර්ථසාධක අරමුදල් අංකය (EPF) :————.
සේවක භාරකාර අරමුදල් අංකය (ETF) :————.

ඉහත අයදුම්කරු මෙම ආයතනයේ/කාර්යාලයේ සේවය කරන බවට සහතික කරමි.

11.5 සේවා යෝජකයාගේ නම :————.

11.6 තනතුර :————.

11.7 අත්සන :————.

නිල මුද්‍රාව.

11.8 දිනය :————.

12. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

